# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2023 අංක 4 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2023 මැයි මස 08 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2023 මැයි මස 12 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල : රු. 40.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2023 අංක 4 දරන**
**දේශීය ආදායම් (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2023 මැයි මස 08 වන දින]

එල්.ඩී.–ඕ. 10/2023

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**1.** (1) මේ පනත 2023 අංක 4 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තියේ විධිවිධාන සහ මේ පනතේ 2 වන, 4 වන, 7 වන, 8 වන, 9 වන, 11 වන, 13 වන, 15 වන, 16 වන, 19 වන සහ 22 වන වගන්තිවල විධිවිධාන, පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) පහත දැක්වෙන වගුවේ *I වන තීරයේ* නිශ්චිතව දක්වා ඇති මේ පනතේ විධිවිධාන මගින් සංශෝධනය කරනු ලබන්නා වූ, ඒ වගුවේ *II වන තීරයේ* නිශ්චිතව දක්වා ඇති (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන, ඒ වගුවේ *III වන තීරයේ* නිශ්චිතව දක්වා ඇති අදාළ දිනවල දී, අවස්ථාවෝචිත පරිදි, ක්‍රියාත්මක විය යුතු ය; නැතහොත් ක්‍රියාත්මක කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

*වගුව*

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *මේ පනතේ වගන්තිය* | *ප්‍රධාන ප්‍රඥප්තියේ සංශෝධනය කරනු ලබන වගන්තිය* | *ක්‍රියාත්මක වන දිනය* |
| 3 | 37(1)(ආ) | 2021.04.01 |
| 5 | 84අ(1ආ) | 2023.01.01 |
| 6 | 85(4) | 2023.01.01 |
| 10 | 113(1)(ආ), 113(1)(ආආ), 113(1අ), 113(1ආ) සහ 113(1ඇ) | 2023.04.01 |
| 12 | 135(3), 135(3අ) සහ 135(4) | 2023.04.01 |

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| මේ පනතේ වගන්තිය | ප්‍රධාන ප්‍රඥප්තියේ සංශෝධනය කරනු ලබන වගන්තිය | ක්‍රියාත්මක වන දිනය |
| 14 | 150(1)(අ), 150(1)(ආ), 150(1)(ඇ) සහ 150(2අ) | 2023.04.01 |
| 17 | 195 | 2018.04.01 |
| 18 | පළමුවන උපලේඛනයේ 4 වන ඡේදයේ (1) වන උපඡේදය, 10 වන ඡේදයේ (1) වන උපඡේදයේ (ඇ)(iii) අයිතමය සහ 13 වන ඡේදය | 2022.10.01 |
| 20 | තුන්වන උපලේඛනයේ (උඋ) ඡේදය | 2022.04.01 |
| 20 | තුන්වන උපලේඛනයේ (වවව) ඡේදයේ (ii) වන සහ (iii) වන උපඡේද | 2022.10.01 |
| 20 | තුන්වන උපලේඛනයේ (තත) ඡේදය සහ (ප) ඡේදයේ (ii) වන, (v) වන සහ (vi) වන උපඡේද | 2023.04.01 |
| 20 | තුන්වන උපලේඛනයේ (බ) ඡේදය | 2021.05.27 |
| 21 | - | 2022.10.01 |

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2අ) (අ) මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින හෝ ඉන් පසුව, යම් තැනැත්තකු විසින් ආදායකයාගේ ගිණුමට පමණක් වන චෙක්පතක් හෝ ආදායකයාගේ ගිණුමට පමණක් වන බැංකු අණකරයක් මගින් හෝ ණය කාඩ්පතක්, හර කාඩ්පතක් හෝ බැංකු ගිණුමක් මාර්ගයෙන් ඉලෙක්ට්‍රොනික ගෙවීම් පද්ධතියක් භාවිතයෙන් හැර වෙනත් යම් ආකාරයකින්, එක් දිනක දී, හෝ තනි ගනුදෙනුවක් සඳහා හෝ යම් එක් අවස්ථාවකට අදාළ තනි ගනුදෙනු මාලාවක් සඳහා මුළු වටිනාකම රු.500,000 ක් හෝ ඊට වැඩි මුදල් ප්‍රමාණයක් වෙනත් තැනැත්තකුට ගෙවනු ලබන අවස්ථාවක,-

(i) මුලින් සඳහන් තැනැත්තාගේ ආදායම ගණනය කිරීමේ දී ඒ ගෙවීම් සම්බන්ධයෙන් කිසිදු අඩුකිරීමක් සඳහා ඉඩ දෙනු නොලැබිය යුතු ය; සහ

(ii) ගෙවන ලද මුදල් ප්‍රමාණ, මුලින් සඳහන් තැනැත්තාගේ වත්කමක පිරිවැයක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ විධිවිධාන-

(i) ශ්‍රී ලංකා රජය හෝ යම් රජයේ ආයතනයක් විසින් කරන ලද ගෙවීමක්;

(ii) බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් කරන ලද ගෙවීමක්; සහ

(iii) අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් තැනැත්තන් පන්ති හෝ ගෙවීම්,

සඳහා අදාළ නොවිය යුතු ය.

(ඇ) මේ උපවගන්තියේ කාර්යය සඳහා-

"බැංකු ගිණුම" යන්නෙන්, ශ්‍රී ලංකාවේ බැංකුවක හෝ මූල්‍ය ආයතනයක පවත්වාගෙන යනු ලබන යම් ගිණුමක් අදහස් වේ;

"රජයේ ආයතනය" යන්නෙන්, ශ්‍රී ලංකා රජයේ යම් දෙපාර්තමේන්තුවක් හෝ ව්‍යවසායක් අදහස් වන අතර, යම් රාජ්‍ය සංස්ථාවක් ද ඊට ඇතුළත් වේ; සහ

"තනි ගනුදෙනුව" යන්නෙන්, තනි ඉන්වොයිසියකින්, ලදුපතකින් හෝ ප්‍රකාශයකින් භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම හෝ ප්‍රසම්පාදනය කිරීම අදහස් වේ.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "වත්කම වෙනස් කිරීමේ දී, වැඩි දියුණු කිරීමේ දී, නඩත්තු කිරීමේ දී හෝ අලුත්වැඩියා කිරීමේ දී" යන වචන වෙනුවට "2021 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වත්කම වෙනස් කිරීමේ දී, වැඩි දියුණු කිරීමේ දී, නඩත්තු කිරීමේ දී හෝ අලුත්වැඩියා කිරීමේ දී සහ 2021 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව වත්කම වැඩි දියුණු කිරීමේ දී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ (i) වන අනුඡේදයේ "ප්‍රමාණයට; හෝ" යන වචන වෙනුවට "ප්‍රමාණයට;" යන වචනය ආදේශ කිරීමෙන්;

(2) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ "ගෙවා ඇත්නම්," යන වචන වෙනුවට "ගෙවා ඇත්නම්; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන්:-

"(iii) ශ්‍රී ලංකාවේ වාසික වූ ද, ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන්නා වූ ද, සමාගමකින් උපයන ලද ප්‍රමාණයට,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ වන වගන්තියේ (1අ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1ආ) (1අ) වන උපවගන්තියේ කාර්යය සඳහා, ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනයක් හරහා උපයන ලද ගෙවීමක් හැර නිර්වාසික තැනැත්තකුට කරන ලද ගෙවීමක් සම්බන්ධයෙන් වන විට, "තැනැත්තකු" යන්නට ශ්‍රී ලංකා රජය ද ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(4) මේ වගන්තියේ කාර්යය සඳහා, ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනයක් හරහා උපයන ලද ගෙවීමක් හැර නිර්වාසික තැනැත්තකුට කරන ලද ගෙවීමක් සම්බන්ධයෙන් වන විට, "තැනැත්තකු" යන්නට ශ්‍රී ලංකා රජය ද ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(7) කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ කාණ්ඩය යටතේ නිර්වාසික තැනැත්තකුට කරන ලද යම් ගෙවීමකින් බදු රඳවා

ගැනීමේ කාර්යපටිපාටිය නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය. සෑම රඳවා ගැනීමේ අනුයෝජිතයකු සහ මූල්‍ය ආයතනයක් විසින් ම ඒ කාර්යපටිපාටියට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(8) 84අ වන වගන්තියේ විධිවිධාන යටතේ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරනු ලැබ ඇති සෑම රඳවා ගැනීමේ අනුයෝජිතයකු විසින් ම, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන පරිදි, එක් එක් කාර්තුව අවසන් වන, ජූනි මස තිස්වන දින, සැප්තැම්බර් මස තිස්වන දින සහ දෙසැම්බර් මස තිස්එක් වන දින සිට දින තිහක් ඇතුළත ත්‍රෛමාසික ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගොනු කරනු ලැබිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තිය සංශෝධනය කිරීම*

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ආආ) බදු ප්‍රතිපත්තිය සහ රජයේ ආදායම පිළිබඳ තීරණ ගැනීමේ කාර්යය සඳහා, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට;".

*ප්‍රධාන ප්‍රඥප්තියට 111අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම*

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 111 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 111අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

*"පාදක වූ බදු ප්‍රතිපත්තිය පිළිබඳව භාණ්ඩාගාර ලේකම්වරයාගේ මතය*

111අ. මේ පරිච්ඡේදයේ මේ කාණ්ඩය හෝ III වන කාණ්ඩය හෝ යටතේ වූ විධිවිධාන අර්ථ නිරූපණය කිරීමේ කාර්යය සඳහා මේ පනතේ යම් විධිවිධානයකට අදාළ පාදක වූ බදු ප්‍රතිපත්තිය පිළිබඳව හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන වෙනත් යම් බදු පනතක් සම්බන්ධයෙන් හෝ භාණ්ඩාගාර ලේකම්වරයාගේ මතය හෝ නිරීක්ෂණ කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබා ගත හැකි ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය සංශෝධනය කිරීම*

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "(1අ) උපවගන්තියට යටත්ව, පනත යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1අ) වන උපවගන්තියට යටත්ව, 2023 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව, පනත යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ආආ) මේ පනත යටතේ වෙනත් යම් ලේඛනයක් ගොනු කිරීම;";

(2) ඒ වගන්තියේ (1අ) වන උපවගන්තියේ "ශ්‍රී ලංකාව තුළ" යන වචන වෙනුවට "2023 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුව, ශ්‍රී ලංකාව තුළ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (1අ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(1ආ) (1ඇ) වන උපවගන්තියට යටත්ව, 2023 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සිට බලාත්මක වන පරිදි, තැනැත්තකු විසින්, ඒ තැනැත්තාගේ බදු වාර්තා, පරිගණක පද්ධතියක් හෝ ජංගම ඉලෙක්ට්‍රොනික උපාංගයක් භාවිත කිරීම මගින් ඉලෙක්ට්‍රොනිකව ගොනු කරනු ලැබිය යුතු ය.

(1ඇ) අදාළ අවස්ථානුගත කරුණු අනුව එසේ අවසරදීම සාධාරණ සහ යුක්තිසහගත බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින්, තක්සේරු වර්ෂයක් සඳහා ලිඛිතව බදු වාර්තාවක් ගොනු කිරීමට තැනැත්තකුට අවසර දෙනු ලැබිය හැකි ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය සංශෝධනය කිරීම*

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තියේ (7) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(8) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද-

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා;

(ආ) සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා;

(ඇ) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා;

(ඈ) වෙනත් යම් රජයේ ආයතනයක භාණ්ඩ, කාර්ය හෝ උපදේශන සහ උපදේශන නොවන සේවා සැපයීම සඳහා වන කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම භාර නිලධරයකු;

(ඉ) මූල්‍ය ආයතනයක්;

(ඊ) කොටස් හුවමාරු ස්ථානයක්; හෝ

(උ) නියෝග මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු හෝ රජයේ ආයතනයක්,

විසින්, නියම කරනු ලැබිය හැකි පරිදි වූ මූල්‍ය ගනුදෙනු පිළිබඳ තොරතුරු ඇතුළු තොරතුරු ඉලෙක්ට්‍රොනික ආකෘතියකින් නිතිපතා කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයීම හෝ ඒ තැනැත්තන් හෝ ආයතන භාරයේ ඇති එවැනි යම් වාර්තා වෙත කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රවේශය ලබා දීම කරනු ලැබිය යුතු ය.”.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- (ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය සංශෝධනය කිරීම)

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "සහකාර කොමසාරිස්වරයා විසින්" යන වචන වෙනුවට "2023 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, සහකාර කොමසාරිස්වරයා විසින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(3අ) (4) වන උපවගන්තියට යටත්ව, සහකාර කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සංශෝධිත තක්සේරුවක් පිළිබඳ දැන්වීමක් බදු ගෙවන්නාට භාර දී ඇති අවස්ථාවක, සහකාර කොමසාරිස්වරයා විසින්-

(අ) (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව; හෝ

(ආ) සහකාර කොමසාරිස්වරයා විසින් සංශෝධිත තක්සේරුව පිළිබඳ දැන්වීම බදු ගෙවන්නාට භාර දීමෙන් පසුව එක් වසරක කාලසීමාව,

යන කාලසීමාවලින් පසුව එළඹෙන කාලසීමාව ඇතුළත, සංශෝධිත තක්සේරුව හා සම්බන්ධ මුල් තක්සේරුව තවදුරටත් සංශෝධනය කළ හැකි ය."; සහ

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "(3) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම වෙනුවට "(3අ) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තිය සංශෝධනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තියේ (5) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "ලිඛිතව" යන වචනය වෙනුවට "ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඇ) මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින හෝ ඉන් පසුව කරනු ලබන සමාලෝචනය සඳහා වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට, කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඒ සමාලෝචනය සඳහා වූ ඉල්ලීම කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබුණු දින සිට වසර දෙකක කාලසීමාවක් ඇතුළත (අ) ඡේදය යටතේ වන ස්වකීය තීරණය සහ ඒ තීරණයට හේතු දැනුම් දෙනු ලැබිය යුතු ය. ඒ තීරණය ඒ කාලසීමාව ඇතුළත දැනුම් දෙනු නොලැබූ අවස්ථාවක, 140 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයට අනුකූලව බදු අභියාචනා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්නම් මිස, ඒ සමාලෝචනය සඳහා වූ ඉල්ලීමට අවසර දී ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 150 වන වගන්තිය සංශෝධනය කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 150 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "තක්සේරුගත බැඳීමට එරෙහිව" යන වචන වෙනුවට "තක්සේරුගත බැඳීමට එරෙහිව හෝ එසේ ගෙවිය යුතු බදු, පොලී, ප්‍රමාද ගාස්තු හෝ දඩ මුදල් ප්‍රමාණයට එරෙහිව" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "අදාළ කර ගත යුතු ය." යන වචන වෙනුවට "අදාළ කර ගත යුතු ය; හෝ" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඇ) බදු ගෙවන්නාගේ ඉල්ලීම මත, ආපසු ගෙවීමේ හිමිකම් පෑම සම්බන්ධයෙන් වූ බදු විගණනයට පෙරාතුව, ආපසු ගෙවිය හැකි ප්‍රමාණයෙන් සියයට හැටක් බදු ගෙවන්නා විසින් ගෙවිය යුතු පසු ආදායම් බද්දට එරෙහිව හිලව් කරනු ලැබිය යුතු ය."; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(2අ) (අ) (2) වන උපවගන්තියේ සඳහන් බදුගෙවන්නා වාසික පුද්ගලයකු වේ නම් සහ ආපසු ගෙවීමේ හිමිකම් පෑම රුපියල් ලක්ෂයක් නොඉක්මවන්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඒ වාසික පුද්ගලයා විසින් ආපසු ගෙවීමේ හිමිකම් පෑම සිදු කිරීමේ දින සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත, බදු විගණනයකට පෙරාතුව, ඒ ආපසු ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුවද, ඒ වාසික පුද්ගලයා වාරික ගෙවන්නකු නොවන ජ්‍යෙෂ්ඨ පුරවැසියකු වේ නම් සහ ඔහුගේ ආපසු ගෙවීමේ හිමිකම් පෑම ජුනි මස තිස්වන දිනයෙන්, සැප්තැම්බර් මස තිස්වන දිනයෙන්,

දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙන් සහ මාර්තු මස තිස් එක් වන දිනයෙන් අවසන් වන යම් කාර්තුවක් සඳහා රුපියල් විසි පන්දහස නොඉක්මවන්නේ නම්, ඒ වාසික පුද්ගලයා විසින් ඒ ආපසු ගෙවීමේ හිමිකම් පෑම සිදු කිරීමේ දින සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත, බදු විගණනයකට පෙරාතුව, ඒ ආපසු ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ගෙවනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ ආපසු ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ගෙවනු ලැබිය යුතු ආකාරය සහ ඒ පිළිබඳ කාර්යපටිපාටිය කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 154 වන වගන්තිය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 154 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "අනුගාමීව එකතු කරනු ලැබූ අවස්ථාවක දී," යන වචන වෙනුවට "මේ පනතේ සඳහන් විධිවිධානවලට අනුකූලව ක්‍රියාත්මක කිරීමේ බද්දක් වශයෙන් හෝ තහනමට ගැනීම මගින් එකතු කරගනු ලැබූ අවස්ථාවක දී," යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 182 වන වගන්තිය සංශෝධනය කිරීම

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 182 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(5) 86 වන වගන්තියේ (7) වන උපවගන්තිය ප්‍රකාරව කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන කාර්යපටිපාටියට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් මූල්‍ය ආයතනයක් රුපියල් පනස් දහසක් නොඉක්මවන මුදල් ප්‍රමාණයක දණ්ඩනයකට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය සංශෝධනය කිරීම

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තියේ "බද්ද" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"බදු අභියාචනා කොමිෂන් සභාව" යන්නෙන්, 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත මගින් පිහිටුවන ලද බදු අභියාචනා කොමිෂන් සභාව අදහස් වේ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 4 වන ඡේදයේ (1) වන උපඡේදයේ, "(2) වන, (2අ) වන සහ (3) වන උපඡේදවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "(2) වන, (2අ) වන, (2ආ) වන සහ (3) වන උපඡේදවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ උපලේඛනයේ 10 වන ඡේදයේ (1) වන උපඡේදයේ (ඇ)(iii) වන අයිතමයේ "ඉක්මවන හෝ සමාන වන අවස්ථාවක දී," යන වචන වෙනුවට "ඉක්මවන අවස්ථාවක දී," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ උපලේඛනයේ 12 වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"**13. ලාභාංශ සඳහා බදු අනුප්‍රමාණය.**

මේ උපලේඛනයේ වෙනත් ඡේදවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ආදායම තුළ 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා වූ ලාභාංශ වලින් ලැබෙන ලැබීම් සහ ලාභ ඇතුළත් වන අවස්ථාවක දී, ඒ ලැබීම් සහ ලාභ මත 15% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ 1 වන ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ (1) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ ඇති සහ යම් තක්සේරු

වර්ෂයක් තුළ ශ්‍රී ලංකාව තුළ පවත්නා ස්වකීය ව්‍යවසායක් පුළුල් කිරීම සඳහා ආයෝජනය කරන තැනැත්තකුට හතරවන උපලේඛනය යටතේ ගණනය කරන ලද ප්‍රාග්ධන දීමනාවලට අමතරව මේ ඡේදයට අනුව ගණනය කරනු ලබන වැඩි කළ ප්‍රාග්ධන දීමනා ප්‍රදානය කරනු ලැබිය යුතු ය.";

(2) ඒ ඡේදයේ (10) වන උපඡේදයේ-

(අ) ඒ උපඡේදයේ "ප්‍රාග්ධන දීමනා වියදම"යන යෙදුමේ අර්ථ නිරූපණයේ "අදහස් වේ; සහ" යන වචන වෙනුවට "අදහස් වේ;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපඡේදයේ "ප්‍රාග්ධන දීමනා වියදම" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

""පවතින ව්‍යාවසාය" යන්නෙන්, තැනැත්තකු විසින් ක්ෂය විය හැකි වත්කම් මත කරන ලද ආයෝජනයේ පළමු දිනයට පෙරාතුව කරගෙන යන ලද යම් ව්‍යාවසායක් අදහස් වේ;

"පුළුල් කිරීම" යන්නට-

(අ) තැනැත්තකුගේ හෝ තැනැත්තකුගේ ආශ්‍රිතයකුගේ පවතින ව්‍යවසායක ක්ෂය විය හැකි වත්කමක පැවරීමක්, මිලදී ගැනීමක් හෝ හුවමාරු කිරීමක්; හෝ

(ආ) තැනැත්තකුගේ ව්‍යාවසායක පවතින ක්ෂය විය හැකි වත්කමක් ප්‍රතියෝජනය කිරීමට ක්ෂය විය හැකි වත්කමක් මිලදී ගැනීමක්,

ඇතුළත් නොවේ ;

"අලුත් ව්‍යවසාය" යන්නට-

(අ) පවත්නා ව්‍යවසාය; හෝ

(ආ) තැනැත්තකුගේ හෝ තැනැත්තකුගේ ආශ්‍රිතයකුගේ පවත්නා ව්‍යවසායක් විභේදනය කිරීමෙන් හෝ ප්‍රතිනිර්මාණය කිරීමෙන් පිහිටුවන ලද ව්‍යාවසායක්,

ඇතුළත් නොවේ;".

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම

(1) ඒ උපලේඛනයේ (උඋ) ඡේදයේ, "ශ්‍රී ලංකා ආණ්ඩුවට සම්පූර්ණයෙන් ම අයත් අස්ථිත්වයකට" යන වචන වෙනුවට "ඍජු හෝ වක්‍ර සාමාජිකත්ව සම්බන්ධතාවයෙන් සියයට පනහකට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා ආණ්ඩුවට අයත් අස්ථිත්වයකට" යන වචන ආදේශ කිරීමෙන්;";

(2) ඒ උපලේඛනයේ (චචච) ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (ii) වන උපඡේදයේ, "84අ වන වගන්තියේ (1අ) වන උපවගන්තිය යටතේ අත්තිකාරම් ආදායම් බද්දට යටත් වන වෙනත් වාසික සමාගමකට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "වෙනත් වාසික සමාගමකට" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (ii) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය එකතු කිරීමෙන්:-

"(iii) වාසික සමාගමක් විසින් නිර්වාසික තැනැත්තකු වන සාමාජිකයකු වෙත ගෙවනු ලබන ලාභාංශයක්, ඒ ලාභාංශය 2023 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව ගෙවා ඇති අවස්ථාවක දී,";

(3) ඒ උපලේඛනයේ (ත) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(තත) රටට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ පිළිබඳව සැලකිල්ලට ගෙන ඒ ව්‍යාපෘතිය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නේ නම් සහ ඒ

ව්‍යාපෘතිය සඳහා සම්පූර්ණයෙන් ම විදේශ ප්‍රදානවලින් අරමුදල් සැපයෙන්නේ නම්, ශ්‍රී ලංකා රජයේ ව්‍යාපෘතියක යෙදී සිටින නිර්වාසික තැනැත්තකු විසින් උපයන ලද මුදල් ප්‍රමාණ;";

(4) ඒ උපලේඛනයේ (ප) ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (ii) වන උපඡේදයේ "2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2023 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (v) වන උපඡේදයේ "2021 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2021 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2023 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ ඡේදයේ (vi) වන උපඡේදයේ "2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව කර ඇත්නම්;" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2023 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව කර ඇත්නම් තක්සේරු වර්ෂ දෙකක කාලසීමාවක් සඳහා;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(5) ඒ උපලේඛනයේ (ප) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(බ) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ එක් එක් තක්සේරු වර්ෂය සඳහා විධිවිධාන සලස්වා ඇති තාක්දුරට, ඒ පනතේ විධිවිධාන යටතේ අනුමත කර ඇති ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් කරගෙන යන යම් බලයලත් තැනැත්තකු වෙත ලැබෙන හෝ උපයන ලැබීම් සහ ලාභ හා ඒ පනතේ 35 වන වගන්තිය ප්‍රකාරව සේවයේ නියුක්ත කරන ලද සේවා නියුක්තයකුගේ සේවා නියුක්ති ආදායම.".

**21.** 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ 4 වන ඡේදයේ (4) වන උපඡේදයේ (අ) අයිතමයේ සඳහන් විධිවිධානවලට අනුකූලව, සමාගමක් විසින් 2022 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වන සහ එකී 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා බදු මුදල් ගෙවා නොමැති වූ ද, එහෙත් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පසුව එළඹෙන මාසයේ තිස්වන දිනයේ දී හෝ ඒ දිනයට පෙර ඒ සමාගම විසින් ගෙවනු ලැබිය යුතු ඒ බදු මුදල ගෙවනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ සමාගම ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව යම් දඩ මුදලක් හෝ පොලියක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

දණ්ඩන හෝ පොලී සම්බන්ධයෙන් වන සහන

**22.** (අ) ව්‍යවසායක් 2018 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹී ඇත්නම්; සහ

(ආ) ඒ ව්‍යවසායේ ලාභ සහ ආදායම හෝ ඒ ව්‍යවසාය විසින් ගෙවනු ලබන යම් ලාභාංශයක් සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබීමට හෝ අඩු ආදායම් බදු අනුප්‍රමාණයක් අනුව බදු අයකරනු ලැබීමට ඒ ගිවිසුමේ විධිවිධාන සලසා ඇත්නම්,

ඒ ව්‍යවසායේ ඒ ලාභ සහ ආදායම හෝ ඒ ව්‍යවසාය විසින් ගෙවනු ලබන ඒ ලාභාංශය හෝ අවස්ථාවෝචිත පරිදි, ගෙවිය යුතු ආදායම් බද්දෙන් තවදුරටත් නිදහස් විය යුතු ය; නැතහොත් ඒ ගිවිසුමේ විධිවිධාන සලසා ඇති අනුප්‍රමාණය මත ආදායම් බද්දට යටත් විය යුතු ය.

සැක දුරු කිරීම

**23.** 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතේ, *'අ'* *වගුව*, *'ආ'* *වගුව* සහ *'ඇ'* *වගුව* මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගු ආදේශ කරනු ලබන අතර, ඒ වගු 2022 අංක 45 දරන දේශීය අදායම් (සංශෝධන) පනතේ 1 වන වගන්තියේ (2) වන, (3) වන, (4) වන සහ (5) වන උපවගන්තිවලට අනුකූලව ක්‍රියාත්මක කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය:-

2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතේ *'අ' වගුව*, *'ආ' වගුව* සහ *'ඇ' වගුව* ප්‍රතියෝජනය කිරීම

"'අ' වගුව (1 වන වගන්තිය)

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *මේ පනතේ වගන්තිය* | *ප්‍රධාන ප්‍රඥප්තියේ සංශෝධනය කරනු ලබන වගන්තිය* |
| 2 | 5 |
| 4 | 12 |
| 5 | 14 |
| 6 | 16 |
| 11 | 66 |
| 18 | 87 |
| 21 | 94 |
| 22 | 120 |
| 24 | 133 |
| 25 | 134 |
| 26 | 135 |
| 27 | 136 |
| 32(1) සහ (3) | 195 |
| 33(1), (2), (3), (4) සහ (5) | පළමුවන උපලේඛනයේ 1 වන ඡේදයේ (1අ) සහ (1ආ) උපඡේද, 3 වන, 4 වන, 5 වන සහ 7 වන ඡේද |
| 34 | දෙවන උපලේඛනයේ 1 වන ඡේදයේ (6අ) උපඡේදය |
| 35(1) | තුන්වන උපලේඛනයේ (උඋ) ඡේදය |
| 37(1) | හයවන උපලේඛනයේ 1 වන ඡේදයේ (4) වන උපඡේදයේ (ආ) අයිතමය |
| 38 | අලුත් වගන්තිය |

'ආ' වගුව (1 වන වගන්තිය)

| I වන තීරය | II වන තීරය |
|---|---|
| මේ පනතේ වගන්තිය | ප්‍රධාන ප්‍රඥප්තියේ සංශෝධනය කරනු ලබන වගන්තිය |
| 8(1) | 19 වන වගන්තියේ (3) වන උපවගන්තිය |
| 33(1) | පළමුවන උපලේඛනයේ 1 වන ඡේදයේ (5) වන උපඡේදය |
| 35(2), (3), (4) සහ (5) | තුන්වන උපලේඛනයේ (ඌඌ), (චච), (චචච) සහ (ඩඩ) ඡේද |
| 36(2) | පස්වන උපලේඛනයේ 2 වන ඡේදය |
| 37(3) සහ (4) | හයවන උපලේඛනයේ 8 වන සහ 10 වන ඡේද |

'ඇ' වගුව (1 වන වගන්තිය)

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| මේ පනතේ වගන්තිය | ප්‍රධාන ප්‍රඥප්තියේ සංශෝධනය කරනු ලබන වගන්තිය | ක්‍රියාත්මක වන දිනය |
| 3 | 10 | 2021.04.01 |
| 7 | 18 | 2021.04.01 |
| 8 | 19(4) | 2018.04.01 |
| 9 | 46 | 2021.04.01 |
| 10 | 54 | 2018.04.01 |
| 12 | 69 | 2018.04.01 |
| 13 | 72 | 2018.04.01 |
| 14 | 73 | 2018.04.01 |
| 15 | 83අ | 2023.01.01 |
| 16 | 84අ | 2023.01.01 |
| 17 | 85 | 2023.01.01 |
| 19 | 88 | 2023.01.01 |
| 20 | 90 | 2021.04.01 |

".

| | | |
|---|---|---|
| 32(2) | 195 | 2020.04.01 |
| 33(1) සහ (7) | පළමුවන උපලේඛනයේ 1 වන ඡේදයේ (1ඇ) උපඡේදය සහ 11 වන ඡේදය | 2023.04.01 |
| 35(6) සහ (7) | තුන්වන උපලේඛනයේ (ද) සහ (ප) ඡේද | 2023.03.31 |
| 36(1) | පස්වන උපලේඛනයේ 1 වන ඡේදයේ (ඉ) උපඡේදය | 2021.04.01 |

”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**24.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.